**උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 67 ක් පුනරුත්ථාපනය කිරීම) - 2014**

---

උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ (නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 67 ක් පුනරුත්ථාපනය කිරීම) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංරා) සහ චීන අපනයන හා ආනයන බැංකුව අතර 2011 අප්‍රේල් 29 දින එළඹි අංක බීඑල්ඒ 201111 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 67 ක් පුනරුත්ථාපනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 56.9 ක් වන අතර ඉන් එජඩො මිලියන 48.3 ක් හෙවත් සියයට 85 ක් මූල්‍යයනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික වැඩ 2011 නොවැම්බර් 10 දින ආරම්භ කරන ලද අතර 2014 මැයි 09 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2014 මැයි 12 දින සම්පූර්ණයෙන් නිම කර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම

පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු  නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

මාර්ග සංවර්ධන අධිකාරියෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබා ගන්නා ලද රු.මිලියන 23.99 ක විශේෂ ණය මුදල වෙනම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කර තිබුණි.

(අ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.758,439 ක් වූ පොදු කාර්ය පිරිවැය අයකර ගැනීම හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඞී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 වගන්තිවලට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත කරන

ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට රු.629,104 ක ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා ගෙවීම.

(ආ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික ගෙවීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් යොදා ගැනීම.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් 2014 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|
| | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) |
| චීන අපනයන - ආනයන බැංකුව | 48.3 | 6,532.5 | 22.92 | 2,996.71 | 42.55 | 5,490.26 |
| ශ්‍රී.ලං.ර. | 8.6 | 1,289.8 | 0.40 | 52.92 | 8.98 | 1,226.18 |
| | **56.9** | **7,822.3** | **23.32** | **3,049.63** | **51.53** | **6,716.44** |

### 3.2 භෞතික ප්‍රගතිය

මාර්ගයේ පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ වැඩ 2014 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද මාර්ගයේ කිලෝමීටර් 51.2 හි ජෙයපුර් මංසන්ධිය හා කිලෝමීටර් 67.5 හි මුන්රම්පිඩ්ඩි මංසන්ධියේ දකුණු පැත්තේ අතුරු මාර්ග සඳහා අත්‍යවශ්‍ය ප්‍රවේශ මාර්ගයන් සපයා නොතිබූ බව විගණකවරුන් විසින් කරන ලද වැඩ බිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද මුලන්කාවිල් මංසන්ධියේ අනතුරුදායක වංගුවෙහි V හැඩයේ ලාංඡනය (Chevron Road Sign Board) සහිත සංඥා පුවරුව සවිකර නොතිබුණි. ඊට අමතරව, ආරම්භක මට්ටමේදී හඳුනානොගත් හෙයින් මන්ඩායික්කුල්ලාරු, පලියාරු හා කල්ලියාඩිහි පාලම් තුන ප්‍රතිසංස්කරණය කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් නිමකිරීම් අදියරේදී හඳුනාගත් නොකරන ලද වැඩ හා දෝෂ රාශියක් දෝෂ වගකීම් කාල පරිච්ඡේදය අවසානයේදී නිම කර තිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස දෝෂ වගකීම් කාලය 2015 නොවැම්බර් 15 දක්වා මාස 6 කින් දීර්ඝ කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත් කොන්දේසිවල 13.6 වගන්තිය අනුව, සුළු හෝ අනියම් ස්වභාවයේ වැඩ සඳහා දිනක වැඩ පදනම මත විචලනයන් සිදු කළ යුතු අතර ඒ සඳහා රු.729,900 ක ප්‍රතිපාදනයන් ප්‍රමාණ පත්‍රයන්හි සලසා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද නිම කිරීම් ප්‍රකාශනය අනුව ආරම්භක වෙන්කිරීමෙන් සියයට 231 ක් නියෝජනය වන රු.මිලියන 1.68 ක් වටිනා වැඩ විචලනයන් ඉහත ප්‍රතිපාදනයන් ඉක්මවා දිනක වැඩ පදනම මත ඉල්ලා තිබුණි. තවද එම වැඩවලින් බොහෝ ප්‍රමාණයක් සුළු හෝ අනියම් ස්වභාවයේ වැඩ නොවූ අතර මෙම විචලනයන් සඳහා නියමිත විචලන නියෝග නිකුත් කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලය 2014 සැප්තැම්බර් 04 දින අවසන් වුවද, කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල 14.9 වගන්තියට පටහැනිව බැංකු ඇපකරයක් ලබාගැනීම මඟින් 2014 ජුනි 26 දින ව්‍යාපෘතිය විසින් රු.මිලියන 163.31 ක් වූ රඳවාගැනීම් මුදල්වලින් කොටසක් ලෙස මුදා හැර තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් ගිවිසුම්වල කරන ලද විධිවිධානයන්ට අනුව ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල්වලින් ප්‍රසම්පාදනය කර සිවිල් කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකවරුන් භාවිතා කරන ලද වත්කම් ව්‍යාපෘතියේ වත්කම් ලෙස සැලකිය යුතුය. කෙසේ වුවද ණය මුදල් වලින් කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රසම්පාදනය කරන ලද වාහන, උපකරණ, ලී බඩු ආදී වත්කම්වල වටිනාකම වෙනම හඳුනා ගෙන ව්‍යාපෘතියේ වාර්තාවලට ගෙන නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**---------------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමාණ පත්‍රවල රු.මිලියන 1,871 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද 2014 මැයි 15 දින කරන ලද අවසාන අතුරු ගෙවීම් සහතිකය අනුව, කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය රු.මිලියන 1,311.69 ක් විය. එබැවින් මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබූ බවත්, රු.මිලියන 168 ක් වූ වැඩපූර්ව අත්තිකාරම් අතාත්වික පිරිවැය ඇස්තමේන්තු පදනම් කරගෙන වැඩිපුර ගෙවා තිබූ බවත් නිරීක්ෂණය විය.

(ආ) මාර්ග වැඩ මත විස්තරාත්මක විමර්ශන සැලසුම් අදියරේදී සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ගයේ සමහර කොටස් වැසි කාලයන්හිදී ජලයෙන් යටවන බව පසුව හඳුනාගෙන තිබූ අතර එයට පිළියමක් වශයෙන් මාර්ගයේ උප පදනම ඉවුරු බැඳීම සඳහා රු.මිලියන 527.5 ක් වටිනා විචලන නියෝගයන් නිකුත් කර තිබුණි. තවද ඉහත විචලනයන් මත පිරිවැය වැඩිවීම අවම කිරීම සඳහා මුල් ප්‍රමාණ පත්‍රයන්හි දක්වා තිබූ මීටර් 10.2 ක මාර්ගයේ පළල මීටර් 9.0 දක්වා අඩුකර තිබුණි.